සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	භූගෝල විද්‍යාව I	කාලය நேரம் Time	පැය 01 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

I පත්‍රය

- මෙම ප්‍රශ්නපත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

1. සංයුතිය අනුව පෘථිවියේ උප පද්ධති ගණන ..... වේ.
(දෙකක්/ තුනක්/ හතරක්)

2. ජල ගෝලයෙන් ..... ක් පමණ සාගර ජලය වේ. (97.5%, 77.5%, 71%)

3. උන්නතාංශය සමග උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ බැසීම ..... ගෝලයේ විශේෂ ලක්ෂණයකි. (තාප/ අපරිවර්ති / පරිවර්ති)

4. මුළුමනින්ම දක්ෂිණාර්ධ ගෝලයේ පිහිටි මහාද්වීපය ..... වේ.
(ආසියාව/ ඕස්ට්‍රේලියාව / දකුණු ඇමරිකාව)

5. බෝර්නියෝ දූපත පිහිටා ඇත්තේ ..... මහද්වීපික තටාකය තුළය.
(අප්‍රිකා / ආසියා / ඕස්ට්‍රේලියා)

06. ශ්‍රී ලංකාවට අයත් රාෂ්ට්‍රිය මුහුදු කලාපය නාවික සැතපුම් ..... දක්වා විහිදෙයි.
(12 / 24 / 200)

07. ජපානය පිහිටා ඇත්තේ ..... භූ තැටියේ ය
(අප්‍රිකානු / යුරේසියානු / පිලිපීන)

08. තේ වගාව ව්‍යාප්ත වීම කෙරෙහි ..... පස වැදගත් වේ.
(වැලි/ ලොම් හා ලැටරයිට් / කබොක්)

09. ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම බිම් ප්‍රමාණයක් වී වගා කරනු ලබන්නේ ..... දිස්ත්‍රික්කයේ ය. (බදුල්ල / කුරුණෑගල / මාතර)

10. 1: 50,000 සිතියමක 10cm දිගට විහිදෙන මාර්ගයක සැබෑ දුර .....km වේ.
(2 / 5 / 10)

Past Papers Wiki

■ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් (නි) යන්න වටා ද වැරදි නම් (වැ) යන්න වටා ද රවුමක් අඳින්න.**

11. පෘථිවි තලයේ සිට 5-6kmක් පමණ දක්වා වන කලාපය තුළ මුළු වායුපරිමාවෙන් 50% ක් අන්තර්ගත වේ. (නි / වැ)

12. ජෛව ගෝලයේ සමතුලිතතාව බිඳ වැටීම කෙරෙහි මිනිස් ක්‍රියාකාරකම් වැඩි බලපෑමක් ඇති නොකරයි (නි / වැ)

13. පැඟිරි වගාව සඳහා ශ්‍රී ලංකාවේ වඩාත් සුදුසුම දිස්ත්‍රික්ක දෙක මාතර හා හම්බන්තොට ය. (නි / වැ)

14. දීර්ඝ කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය දේශගුණය ලෙස හඳුන්වයි. (නි / වැ)

15. මෙරට ශ්‍රම බලකායෙන් 3/4 කට ඍකියා සපයන්නේ කෘෂි අංශයෙනි (නි / වැ)

■ **අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. ලෝකයේ උසම ස්ථානයක පිහිටි විල ..... විලයි.

17. නිවර්තන දේශගුණ කලාපයේ ඇති විශේෂිත දේශගුණ වර්ගයක් ලෙස ..... දේශගුණය දැක්විය හැක.

18. කාබන් ප්‍රතිශතය 97% - 99% ක් තරම් වූ ලෝකයේ උසස් ම වර්ගයේ මිනිරන් පවතින රට . ..... යි.

19. ශ්‍රී ලංකාවේ සංචාරක අධිකාරිය විසින් ප්‍රධාන සංචාරක කලාප ..... හඳුනා ගෙන ඇත.

20. එක් සුවිශේෂි කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇති සිතියම් ..... සිතියම් ලෙස හඳුන්වයි.

■ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දක්වා ඇත. ඒවා නිවැරදි ලෙස ගැලපූ විට ලැබෙන පිළිතුරට හිමි අංකය තිත් ඉරමත ලියා දක්වන්න.**

21.

අ පර්යේෂන ආයතන	ආ වගාවන්
1. තලවකැලේ	A රබර්
2. අගලවත්ත	B තේ
3. මාතලේ	C වී
	D සුළු අපනයන භෝග

(1) A, B, C (2) B, A, D (3) C, D, A (4) D, A, B (.....)

22.

අ. භූ තැටි	ආ රටවල්
1. ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය	A ඉන්දියාව
2. අප්‍රිකානු තැටිය	B බ්‍රසීලය
3. දකුණු ඇමරිකානු තැටිය	C මැඩගස්කරය
	D නෝර්වේ

(1) A, C, B (2) A, B, C (3) B, A, C (4) D, B, C (.....)

Past Papers Wiki

23.

අ.		ආ	
වී වගා කරන රටවල්		ගංගා නිම්න	
1.	උතුරු ඇමරිකාව	A	නයිල් නිම්නය
2.	අප්‍රිකාව	B	පෝ ගංගා නිම්නය
3.	ඉතාලිය	C	සැක්‍රමැන්ටෝ නිම්නය
		D	මරේඩාලින් නිම්නය

(1) A, B, C (2) B, A, D (3) C, A, B (4) D, A, B (.....)

24.

අ		ආ	
ධීවර කර්මාන්තය		අල්ලනු ලබන මසුන්	
1.	කරදිය	A	මෝරා, කනයා
2.	මිරිදිය	B	ඉස්සන්, කකුළුවන්
3.	කිවුල් දිය	C	අලගඩුවා, කොප්පරා
		D	ලූලා, තිලාපියා


(1) A, B, C (2) B, A, D (3) C, D, B (4) D, C, B (.....)

25.

අ		ආ	
ගෘහ කර්මාන්ත		ව්‍යාප්ත ප්‍රදේශ	
1.	වේවැල් භාණ්ඩ	A	අම්බලන්ගොඩ
2.	පිත්තල භාණ්ඩ	B	පිලිමතලාව
3.	වෙස්මුහුණු	C	ගාල්ල
		D	රදාවඩුන්න

(1) A, B, D (2) B, D, A (3) C, B, A (4) D, B, A (.....)

■ **අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.**



26. ප්‍රස්තාරයට අනුව සාක්ෂරතාව අඩුම රට ..... යි.

27. සාක්ෂරතාව වැඩිම රට ..... යි.

28. උපතේ දී අයු අපේක්ෂාව වැඩිම රට ..... යි.

29. දකුණු ආසියාතික රටවල් අතුරෙන් සාක්ෂරතාව අඩුම රට ..... යි.

30. දකුණු ආසියාතික රටවල් අතුරෙන් සාක්ෂරතාව හා උපතේදී ආයු අපේක්ෂාව වැඩිම රට ..... යි.

■ **අංක 31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

31. සම්පූර්ණයෙන්ම ගොඩබිමින් වටවූ මුහුදක් වන්නේ
(1) කැස්පියන් මුහුද (2) මධ්‍යධරණී මුහුද
(3) කහ මුහුද (4) උතුරු මුහුද (.....)

32. විලකින් ආරම්භ වන ගංගාවක් වන්නේ මින් කුමක්ද?
(1) මරේඩාලින් (2) යූරල් (3) නයිල් (4) මිසිසිපි (.....)

33. මහාද්වීපික කබොල නිර්මාණය වී ඇත්තේ කුමන පාෂාණයකින් ද?
(1) සිලිකේට් (2) ග්‍රැනයිට් (3) මැග්නීසියම් (4) බැසෝල්ට් (.....)

34. * සාමාන්‍ය උෂ්ණත්වය අඩු ය.
* ඍතු භේදය නිසා උෂ්ණත්වය අඩු වැඩි වේ.
* පැහැදිලි උණුසුම් ඍතුවක් සහ වර්ෂාපතනය සහිත ශීත ඍතුවක් දක්නට ඇත.
ඉහත ලක්ෂණ අයත් දේශගුණ වර්ගය වන්නේ
(1) නිවතර්න දේශගුණය (2) මධ්‍යධරණී දේශගුණය
(3) තුන්දා දේශගුණය (4) සෞම්‍ය දේශගුණය (.....)

35. වී වගාව ආශ්‍රිත වැඩි ඵලදාවක් ලබාදීමට හඳුන්වා දී ඇති වී ප්‍රභේදයක් වන්නේ
(1) කප්සෙත (2) කප්සුවය
(3) නොරින් 10 (4) AT 307 (.....)

36. කල් පැවැත්ම, ශක්තිය, දරා සිටීමේ හැකියාව, නම්‍යශීලීබව, කම්පනයට ඔරොත්තු දීම ලාභදායී නිෂ්පාදනයක් වීම යන ගුණ ලක්ෂණ ඇති නිෂ්පාදන කර්මාන්තය කුමක්ද?
(1) යකඩ හා වානේ (2) ගල් අඟුරු
(3) මිනිරන් (4) ඇලුමිනියම් (.....)

37. කෘෂි තාක්ෂණික උද්‍යානයක් පිහිටුවා ඇත්තේ
(1) මාතලේ (2) කුරුණෑගල
(3) ගන්නෝරුව (4) රාජාංගනය (.....)

38. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝගයක් ලෙස කජු වගාව ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කයක් වන්නේ
(1) මන්නාරම (2) මාතලේ (3) මාතර (4) නුවරඑළිය (.....)

39. 1:50,000 භූ ලක්ෂණ සිතියමක නිල්පැහැය භාවිත කර ඇත්තේ කුමන ලක්ෂණයක් දැක්වීම සඳහා ද?
(1) සංචාරක තොරතුරු (2) මායිම් (3) මාර්ග (4) ජලවහනය (.....)

40. ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි සකස් කොට ඇති 1:50,000 සිතියම් සංඛ්‍යාව වන්නේ
(1) 92 කි. (2) 90 කි. (3) 50 කි (4) 40 කි (.....)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය	භූගෝල විද්‍යාව II	කාලය / நேரம் / Time: පැය 02 යි

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතු ය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

I කොටස

1) (අ) ඔබට සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) A සහ B අක්ෂරවලින් දැක්වෙන පරිපාලන මායිම් දෙක නම් කරන්න. (ල. 02)

(ii) C - D රේඛාවෙන් දැක්වෙන භෞතික ලක්ෂණය කුමක්ද? (ල. 01)

(iii) E අක්ෂරයෙන් නිරූපණය වන්නේ කුමක් ද? (ල. 01)

(iv) සිතියම් ප්‍රදේශයේ වගා කටයුතු සඳහා බහුලවම ජලය ලබා ගන්නා ක්‍රමය කුමක්ද? (ල. 01)

(v) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන වගා කටයුතු දෙකක් නම් කරන්න. (ල. 02)


(vi) පහත A, B, C ලෙස දක්වා ඇති ප්‍රකාශ සිතියමෙහි දැක්වෙන තොරතුරු අනුව නිවැරදි නම් "නි" යන්න ද, වැරදි නම් "වැ" යන්න ද ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - සිතියම් ප්‍රදේශයේ ඊසාන කාර්තුවෙහි වාරි ඇළ මාර්ගයක් දක්නට ලැබේ.

B - සිතියම් ප්‍රදේශයෙහි වැඩි වශයෙන් ව්‍යාප්තව ඇත්තේ වනාන්තරය.

C - සිතියම් ප්‍රදේශයේ උපරිම උන්නතාංශය 271.58m පමණ වේ. (ල. 1x3=3)


(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියේ ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා පිළිතුරු පත්‍රයෙහි ලියන්න.



Past Papers Wiki

(i) A, B, C අක්ෂර අතුරෙන් ටිටිකාකා විල දැක්වෙන අක්ෂරය කුමක්ද?
(ii) D, E, F අක්ෂර අතුරෙන් වොල්ගා ගංගාව දැක්වෙන අක්ෂරය කුමක්ද?
(iii) G, H, I අක්ෂර අතුරෙන් ඇල්ප්ස් කඳු දැක්වෙන අක්ෂරය කුමක්ද?
(iv) J. K, L අක්ෂර අතුරෙන් බෝෆට් මුහුදු දැක්වෙන අක්ෂරය කුමක්ද?
(v) M, N, O අක්ෂර අතුරෙන් ජැමෙයිකා දූපත දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියේ ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා පිළිතුරු පත්‍රයෙහි ලියා දක්වන්න.




(i) A, B, C අක්ෂර අතුරෙන් උඩරට ප්‍රදේශයට අයත් තේ වගා කරන දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක්ද?
(ii) D, E, F අක්ෂර අතුරෙන් පර්ල් මුතුපරය දැක්වෙන අක්ෂරය කුමක්ද?
(iii) G, H, I අක්ෂර අතුරෙන් ආරුගම් බොක්ක දැක්වෙන අක්ෂරය කුමක්ද?
(iv) J, K, L අක්ෂර අතුරෙන් ශ්‍රී ලංකාවේ කජු වගාව සිදු කරන දිස්ත්‍රික්කයක් දැක්වෙන අක්ෂරය කුමක්ද?
(v) M, N, O අක්ෂර අතුරෙන් බෝල මැටි නිධියක් පිහිටි දෙදියවල ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක්ද?

II කොටස

2) (i) පෘථිවියේ ජලය ව්‍යාප්තව ඇති ජල මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල. 02)
(ii) පහත අංක 01 රූප සටහන මඟින් ජල චක්‍රයෙහි ක්‍රියාවලිය නිරූපණය වේ. රූපසටහන ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක 01 රූප සටහන



Past Papers Wiki

(අ) පෘථිවි වායුගෝලයට ජලවාෂ්ප ලැබෙන ප්‍රධාන ක්‍රියාවලි දෙක A සහ B අක්ෂර වලින් දැක්වේ. එම ක්‍රියාවලි නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(ආ) වර්ෂාපතනයෙන් පෘථිවියට ලැබෙන ජලය ජල මූලාශ්‍රවලට සම්බන්ධවන ක්‍රියාවලි දෙක C සහ D අක්ෂර මඟින් දැක්වේ. එම ක්‍රියාවලි දෙක නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iii) ජලයෙහි ගුණාත්මක භාවය පිරිහීමට බලපාන මානව ක්‍රියාකාරකම් දෙකක් නම්කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

3) (i) (අ) දූපතක් යනු කුමක්ද? (ල. 02)

(ආ) පහත සඳහන් මහද්වීපික තටක තුළ පිහිටි දූපත් එක බැගින් නම් කරන්න.
අප්‍රිකා මහද්වීපික තටකය
ඕස්ට්‍රේලියා මහාද්වීපික තටකය (ල. 02)

(ii) සානුවක් යනු කුමක්ද යන්න හඳුන්වන්න. (ල. 02)

(iii) ලෝකයේ තැනිතලා ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්තව ඇති මානව ක්‍රියාකාරකම් දෙකක් නම් කර එම ප්‍රදේශ ආශ්‍රිතව මානව කටයුතු බහුලවීමට හේතු කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

4) (i) කෘෂිකාර්මික භූමි පරිභෝගයෙහි ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න. (ල. 02)

(ii) පහත සඳහන් කෘෂිභෝග වර්ග අතුරින්
(අ) වතු කෘෂිකාර්මික භෝග වර්ග දෙකක්
(ආ) සාම්ප්‍රදායික සුළු අපනයන භෝග වර්ග දෙකක්
(ඉ) සම්ප්‍රදායික නොවන සුළු අපනයන භෝග වර්ග දෙකක් නම් කරන්න. (ල. 03)
(මිරිස්, තේ, කපු, ගම්මිරිස්, රටකජු, කුරුඳු)

(iii) දේශීය එළවළු සහ පළතුරු වගාව නංවාලීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

5) (i) ලෝකයේ ව්‍යාපාරික කිරි පට්ටි පාලනය සිදු කරන ,
(අ) උත්තරාර්ධ ගෝලයේ රටවල් දෙකක්
(ආ) දක්ෂිණාර්ධ ගෝලයේ රටවල් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) (අ) ලෝකයේ කිරිපට්ටි පාලනය දියුණුවීම කෙරෙහි බලපාන ලද සාධක තුනක් නම් කරන්න. (ල. 03)

(ආ) කිරිපට්ටි පාලනය සිදු කරන රටවල් විසින් වෙළඳපොළට ඉදිරිපත් කරන කිරි ආශ්‍රිත නිෂ්පාදන වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

(iii) ලෝකයේ කිරිපට්ටි පාලනයේ හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 03)

6) පහත අංක 02 සිතියම ඇසුරින් වී වගාව පදනම් කරගෙන ශ්‍රී ලංකාව බෙදිය හැකි කෘෂි පාරිසරික කලාප නිරූපණය වේ.

අංක 02 - සිතියම



(i) ඉහත සිතියමෙහි 1, 2, 3, 4 අංකවලින් දැක්වෙන පාරිසරික කලාප හතර අනුපිළිවෙළින් නම් කරන්න. (ල. 02)

(ii) (අ) අංක 1 සහ 3 කලාපවල පිහිටි වී පර්යේෂණ ආයතන එක බැගින් වෙන වෙනම නම් කරන්න. (ල. 02)

(ආ) සිතියමෙහි අංක 3න් දැක්වෙන පාරිසරික කලාපයෙහි හඳුනාගත හැකි ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) ශ්‍රී ලංකාවේ වී වගාව මෑතකාලීනව මුහුණපාන ගැටලු දෙකක් නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

7) (i) ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තය සිදුකරන ප්‍රමුඛ රටවල් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) යකඩ හා වානේ ඉල්ලුම වැඩිවීමට බලපාන ලද හේතු තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (අ) ලෝකයේ විද්‍යුත් කර්මාන්තය යටතේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

(ආ) විද්‍යුත් කර්මාන්තයේ ලක්ෂණ දෙකක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 03)

8) (i) (අ) පෙට්‍රෝ රසායන කර්මාන්තය යනු කුමක්ද? (ල. 02)

(ආ) පෙට්‍රෝ රසායන කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත තුනක් නම් කරන්න. (ල. 03)

(ii) පෙට්‍රෝ රසායන කර්මාන්තය පවත්වාගෙන යාමෙන් ශ්‍රී ලංකාවට අත්වන වාසි දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(iii) ශ්‍රී ලංකාවේ මෝටර් රථ කර්මාන්තයෙහි ප්‍රවණතා දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	භූගෝල විද්‍යාව II / புவியியல் II	කාලය நேரம் Time

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....



Scale : 1:50000

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library